# 2026 ජනවාරි මාසයට අදාලව 2026.01.12 වන දින පවත්වන ලද
# බිබිල ප්‍රාදේශීය සභාවේ විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2026.01.12

**වේලාව** - ප.ව.2.00

**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 15. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ටෙන්ඩර් කර බදු ලබා දෙනු ලබන දේපල වලට අදාල අදාළ ටෙන්ඩරය 2025.12.22 දින විවෘත කරනු ලැබූ අතර එම අවස්ථාවේදී ටෙන්ඩර් නොවූ පහත සඳහන් දේපල ටෙන්ඩර් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම විශේෂ මහ සභාවට කැඳවූ බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

1. පිටකුඹුර සතිපොළ
2. අංක 01 කුකුළු මස් වෙළඳසැළ
3. අංක 02 කුකුළු මස් වෙළඳසැළ
4. කරවල වෙළඳසැළ
5. ප්‍රාදේශීය සභාව අසළ පොදු වැසිකිළිය

**ටෙන්ඩර් කොන්දේසි කඩ කළ බදුකරුවන් අසාදු ලේඛන ගත කිරීම.**

01. අංක 01 කුකුළු මස් වෙළඳසැළ සඳහා එක ටෙන්ඩරයක් පමණක් ඉදිරිපත් කර තිබූ අතර එම ටෙන්ඩරය ඉදිරිපත් කර තිබූ එම්.එච්.එම්. සපාන් මහතා හට ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. ඒම අවස්ථාවේදී ටෙන්ඩරය භාර ගත්තද පසුව ලිපියක් ඉදිරිපත් කර එම ටෙන්ඩරය අත්හරින බව දැනුම්දී ඇත.

02. එසේම උඩුබුබුල විවේකාංගනය සඳහා කේ.එම්.විජේසිංහ මහතා විසින් අවම ලංසුවට වඩා අඩු

මුදලක් ඉදිරිපත් කර තිබුණි.

03. බිබිල එළගවමස් වෙළඳසැළ සඳහා වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කර තිබූ මොහොමඩ් නියාස් මහතා හට ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. ඒම අවස්ථාවේදී ටෙන්ඩරය භාර ගත්තද පසුව ලිපියක් ඉදිරිපත් කර එම ටෙන්ඩරය අත්හරින බව දැනුම් දී ඇත. පසුව දෙවනුවට වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ හනීපා මොහොමඩ් නසීර් යන අයද එම බඳු මුදල් ගෙවීමට නොහැකි බව පවසා ටෙන්ඩරය අත්හරින බව ලිපියක් මගින් දැනුම්දී ඇත.

එම්.එච්.එම්. සපාන්, කේ.එම්.විජේසිංහ, මොහොමඩ් නියාස්, හනීපා මොහොමඩ් නසීර් යන බඳුකරුවන් විසින් ටෙන්ඩර් කොන්දේසි කඩ කර ඇති බැවින් ඒ අයගේ නම් අසාදු ලේඛන ගත කිරීමටත් 2026 වර්ෂය සඳහා බඳු ගැනීමට අයදුම්පත් ලබා ගැනීමේදී තැම්පත් කරන ලද ආපසු ගෙවන ඇපතැම්පතු මුදල සභාව සතු කර ගැනීමටත් සුදුසු බව මූලාසනය විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකගතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකගතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>පිටකුඹුර සතිපොළ</u>

2025.12.22 දින විවෘත කරනු ලැබූ ටෙන්ඩරයෙහි බිබිල ප්‍රාදේශීය සභාව සතු පිටකුඹුර සතිපොළ බඳු ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොතිබුණු බැවින් එම දේපල නැවත ටෙන්ඩර් කිරීම පිළිබඳව තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්චඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

පිටකුඹුර සතිපොළ නැවත ටෙන්ඩර් කිරීමේදී අවම ලංසු මුදල වන රු.300,000.00 මුදල අඩු නොකර එම මුදලටම ටෙන්ඩර් කිරීමටත් එසේ ටෙන්ඩර් කිරීමේදී බඳු ලබා නොගන්නේ නම් එම සතිපොළෙන්ද පොළ කාසි බිබිල ප්‍රාදේශීය සභාව මගින්ම අය කිරීම් කටයුතු සිදු කිරීමටත් ඒ සඳහා බිබිල සතිපොළෙහි පොළ කාසි එකතු කරනු ලබන බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයම යෙදවීමටත් සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>අංක 01 කුකුළු මස් වෙළඳසැල</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපලක් වන අංක 01 කුකුළු මස් වෙළඳසැල 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කර බදු ලබාදීම සඳහා ඉදිරිපත් කළද 2025.12.22 දින පැවති ටෙන්ඩර් විවෘත කිරීමේදී එක් ටෙන්ඩරයක් පමණක් ඉදිරිපත් වී තිබුණු අතර එම ටෙන්ඩරය ඉදිරිපත් කළ එම්.එච්.එම්. සපාන් මහතා හට ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. එම මහතා ටෙන්ඩරය එම අවස්ථාවේ භාර ගත්තද පසුව ලිපියක් මගින් එම ටෙන්ඩරය අත්හරින බව දන්වා ඇත. මෙම වෙළඳසැල නැවත ටෙන්ඩර් කිරීම සඳහා තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්චඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අංක 01 කුකුළු මස් වෙළඳසැල අවම ලංසු මුදල වන රු.500,000.00ක මුදලින් 5%ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## අංක 02 කුකුළු මස් වෙළඳසැල

බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපලක් වන අංක 02 කුකුළු මස් වෙළඳසැල 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කළද මෙම වෙළඳසැල බඳු ගැනීමට කිසිවකු ටෙන්ඩර් ඉදිරිපත් කර නොතිබීම නිසා එම වෙළඳසැල නැවත ටෙන්ඩර් කිරීම සම්බන්ධව තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අංක 01 කුකුළු මස් වෙළඳසැල අවම ලංසු මුදල වන රු.480,000.00ක මුදලින් 5%ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## කරවල වෙළඳසැල

2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කර බඳු ලබාදීමේ ටෙන්ඩරය 2025.12.22 දින විවෘත කළද එම වෙළඳසැල බඳු ගැනීමට කිසිඳු බඳු කරුවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් එම වෙළඳසැල නැවත ටෙන්ඩර් කිරීම පිළිබඳව තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

කරවල වෙළඳසැල අවම ලංසු මුදල වන රු.60,000.00ක මුදලින් 5%ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## බිබිල ප්‍රාදේශීය සභාව අසළ පොදු වැසිකිළිය

බිබිල ප්‍රාදේශීය සභාව සතු ටෙන්ඩර් කර බඳු ලබා දෙනු ලබන බිබිල ප්‍රාදේශීය සභාව අසළ පොදු වැසිකිළිය රු.140,000.00 කට 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කරනු ලැබුවද මෙම ටෙන්ඩරය ලබා ගැනීමට කිසිඳු බඳුකරුවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් එම පොදු වැසිකිළිය නැවත ටෙන්ඩර් කිරීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව අසළ ඇති පොදු වැසිකිළිය බිබිල ප්‍රාදේශීය සභාව මගින්ම දිවා කාලයේදී පවත්වාගෙන යා හැකි වුවත් රාත්‍රී කාලයේදී පවත්වාගෙන යාමේ දී ගැටලු මතුවන බැවින් රාත්‍රී කාලයේදී වසා තැබීමට සිදුවන බවයි. එසේ වුවහොත් දුර ගමන් සේවාවල යෙදෙන බස්රථ නිතර ප්‍රාදේශීය සභාව අසළ නතර කරන බැවින් ඒවායෙහි පැමිණෙන මගීන් අපහසුතාවයට පත්වන බවත් එබැවින් ටෙන්ඩර් කර බඳු ලබාදීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ප්‍රාදේශීය සභාව අසළ ඇති පොදු වැසිකිළිය අවම ලංසු මුදල වන රු.140,000.00ක මුදලින් 5%ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට සුදුසු බවත් ටෙන්ඩරය භාර ගැනීමට බඳුකරුවෙකු ඉදිරිපත් නොවුවහොත් බිබිල ප්‍රාදේශීය සභාව මගින්ම පවත්වාගෙන යාමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**නැවත ටෙන්ඩර් කිරීමට තීරණය කරනු ලැබූ දේපල ටෙන්ඩර් කරනු ලබන අවම දින ගණන, දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන කාලසීමාව ,විවෘත කරන දිනය , දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේ දිස්ත්‍රික් මට්ටමින්ද පළාත් මට්ටමින්ද දීප ව්‍යාප්තවද යන්න තීරණය කිරීම.**</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් දේපල වලින් 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කළද ටෙන්ඩර් නොවූ පිටකුඹුර සතිපොළ, අංක 01 කුකුළු මස් වෙළඳසැල ,අංක 02 කුකුළු මස් වෙළඳසැල ,කරවල වෙළඳසැල ,ප්‍රාදේශීය සභාව අසළ පොදු වැසිකිළිය යන දේපල

- ටෙන්ඩර් කරනු ලබන අවම දින ගණන
- ටෙන්ඩර් දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන කාලසීමාව
- ටෙන්ඩර් විවෘත කරන දිනය
- ටෙන්ඩර් දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලැබුවේ දිස්ත්‍රික් මට්ටමින්ද පළාත් මට්ටමින්ද දීපව්‍යාප්තවද යන්න තීරණය කිරීම.

සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් දේපල වලින් 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කළද ටෙන්ඩර් නොවූ දේපල

- දින 14ක් ඇතුළත ටෙන්ඩර් කිරීමටත්
- 2026.01.12 දින සිට 2026.01.30 දින දක්වා ප්‍රදර්ශනය කිරීමටත්
- 2026.01.30 දින ප.ව.2.00ට ටෙන්ඩර් පෙට්ටිය මුද්‍රා තබා ප.ව.2.10ට ටෙන්ඩර් පෙට්ටිය විවෘත කිරීමටත්
- ටෙන්ඩර් දැන්වීම් පළාත් මට්ටමින් ප්‍රදර්ශනය කිරීමට හා පුවත්පත්වල ප්‍රසිද්ධ නොකිරීමටත්

තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මූලාසනය විසින් 2026.012.12 දින විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ සියළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූති කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි